# ගමේ පොල



**කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගම්බද පොළවල් අලළා පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරි එස්. එම්. පී. සේනානායක විසින් පළකර ඇති අධ්‍යයන වාර්තාවක ශ්‍රී ලංකාවේ ගම්බද පොළවල වර්ධනය පිළිබඳව කරුණු රැසක් අඩංගුව ඇත. මෙම ලිපිය එම වාර්තාව ආශ්‍රයෙන් සකස් කරන ලද්දකි.**

ශ්‍රී ලංකාවේ ගම්බද වෙළෙඳ පොළවල පරිණාමය පිළිබඳ තොරතුරු හිඟ ය. 'පොළ' යනුවෙන් පොදුවේ හැඳින්වෙන මේවායෙහි වර්ධනය ආගමික උත්සව සහ වන්දනා හා සම්බන්ධව ඇති වූවකැයි ද, සාමාන්‍ය ගම්බද ජනයා බඩු මිළ දී ගන්නා වාර්ෂික ලොකුම උත්සව සැනකෙළිය වූයේ එම අවස්ථාවන් යයි ද ඒ. ඩී. එන්. ප්‍රනාන්දු (1975) සඳහන් කරයි. මෙකී උත්සව බොහොම යක් ම අස්වනු සමයෙන් පසුව පැවති බැවින් තම තමන්ට අවශ්‍ය දෑ එවැනි ස්ථානවලින් මිළ දී ගැනීමට තරම් ප්‍රමාණවත් අයුරින් මිළ මුදල් ආදිය ගැමියන් අත ගැවසිණි. කෙසේ වෙතත්, මේ විස්තරය පටු එකක් බව පෙනෙන්නට තිබේ. ගම්බද පොළවල් වනාහි 20 වැනි සියවසේ ඇති වූ වර්ධනයෙකැයි ආණ්ඩුවේ නා නා විධ ලේඛන මෙන් ම වෙනත් ආරංචි මාර්ග ද පරීක්ෂා කිරීමෙන් පසුව ඩී. ඩබ්. ජැක්සන් (1977) නිගමනයකට පැමිණ ඇත. ශ්‍රී ලංකාවේ ගම්බද පොළවල මූලාරම්භය 19 සියවසේ අග භාගයට වඩා එහාට නොවිහිදෙන බව ඇය ගේ කල්පනාව ය.

එවක දිවයිනෙහි වෙළෙඳ සැල් කිහිපයක් හැරෙත්නට වෙළෙඳ පොළවල් තිසිත් නොතිබි බව රොබර්ට් නොක්ස් තම ජීවිත කතා පොතෙහි සඳහන් කර ඇත. 'මෙහි සියළු මුදල් වර්ග හිඟ

වන අතර, ගැනීම හෝ විකිණීම හෝ සාමාන්‍ය යෙන් කෙරෙන්නේ භාණ්ඩ හුවමාරුව මගින් ය'යි ඔහු පවසයි.

### තවලම

ශ්‍රී ලංකාව මුදල් හුවමාරු ආර්ථිකයට ඇතුළු වන තෙක්ම හුවමාරුව පිළිබඳ ඉතාමත් පොදු භාවිතා ක්‍රමය වූයේ භාණ්ඩ හුවමාරු ක්‍රමය යි. පුරාණ කාලවල කුල ක්‍රමය මත පදනම් වූ වැඩවසම් සමාජය පොදුවේ ගත් කළ ස්වයංපෝෂිත එකක් විය. ඒ නිසා, එක් භාණ්ඩයක් තවත් භාණ්ඩයකට හුවමාරු කිරීම තුළින් මෙන් ම ඔවුන්ට අවශ්‍ය දෙයක් සඳහා ඔවුන්ට සැපැයිය හැකි වෙනත් දෙයක් රටේ වෙනත් ප්‍රදේශ කරා ගෙන යාම තුළින් ද තම පැවැත්ම රඳා පවත්වා ගෙන යාමට ඔවුන්ට ප්‍රමාණවත් ඉඩකඩ තිබුණා විය හැකි ය. එබැවින්, යහපත් මහා මාර්ග බිහි වීමට පෙර රළු මං පෙත් ඔස්සේ පුරුදු පුහුණු කළ හරකුන් යොදා 'තවලම' මගින් භාණ්ඩ ගෙන යාමට පමණක් අතීතයේ රටේ අභ්‍යන්තර වෙළෙඳාම සීමා වී තිබිණි. ලුණු, රෙදි පිළි, කරවල වැනි වෙරළබඩ නිෂ්පාදන තවලම් මගින් රට ඇතුළතට ගෙන ගිය වෙළෙන්දෝ පුවක්, ධාන්‍ය, කෝපි, හකුරු වැනි ද්‍රව්‍ය පටවා ගෙන ආපසු පිටත් වූහ.

අතීතයේ අභ්‍යන්තර වෙළෙඳාම එසේ පැවතියේ වුව ද, එම වෙළඳාම සඳහාත් බලපෑ එක්තරා අන්දමක සීමා බන්ධන තිබුණු බව සයිමන් කාසි චිට්ටි (1834) සඳහන් කර ඇත. ස්ථිර මාර්ග පහසුකම් හිඟවීම, රට ඇතුළත එක් දිස්ත්‍රික්කයක සිට තවෙකකට ඇතුල් වීමේ දී බලපෑ කඩඉම් නීති හා රේගු බදු සහ අභ්‍යන්තරය හා මුහුදු බඩ පළාත් අතර අය කෙරුණ තදබල බදු ආදිය ඒවා ය. දිවයින බ්‍රිතාන්‍යය විසින් අත්පත් කර ගනු ලැබුවාට පසුව ශ්‍රී ලංකාවේ වාර වෙළෙඳ පොළවල් සීඝ්‍ර යෙන් වර්ධනය වූ බව ඩී. ඩබ්ලිව්. ජැක්සන් කියයි. ප්‍රධාන වශයෙන් දේශපාලනමය ඒකීය භාවයක් ඇතිවීම නිසා වෙළෙඳාම පිළිබඳ වාතාවරණය වඩාත් යහපත් වීම ද, ප්‍රවාහන පද්ධතිය පුළුල් වීම ද, පාරිභෝගික ඉල්ලුමෙහි වර්ධනය නිසා අලෙවිය සඳහා වැඩි වැඩියෙන් භාණ්ඩ නිෂ්පාදනය කිරීම සහ වැවිලි ආර්ථිකය සංවර්ධනය වීම ද මේ තත්ත්වයට තුඩුදුන් හේතු ය. මීට තුඩුදුන් දෙවැනි කාරණය හැටියට පෙනෙන්නට ඇත්තේ වෘත්තීයමය විශේෂඥතාවය දියුණුවීමත්, ආර්ථික ප්‍රභේදනයක් ඇතිවීම සහ ගණුදෙණුව සඳහා මුදල් භාවිතා කිරීමත් ය.

විසි අටවැනි සියවස මුල දී ගම්බද එක් එක් පොළවල් අතර තිබී ඇත්තේ සුළු සම්බන්ධයක් බව ජැක්සන් ගේ මතය වේ. සුදුසු පරිදි බෙද වෙන් කරන ලද කාල වකවානු ක්‍රමයක් නොමැතිව වෙන් වෙන් වශයෙන් ඒවා පවත්වා ගෙන යන ලද අතර, මහා මාර්ග ඔස්සේ සහ දුම්රිය මගින් ද, පාරිභෝජනය සඳහා නාගරික මධ්‍යස්ථානවලට භාණ්ඩ ප්‍රවාහනය කරනු පිණිස එක් එක් පොළක් මගින් එහි ප්‍රත්‍යන්ත ප්‍රදේශයෙන් එළවළු එකතු කරන ලදී. නාගරික මධ්‍යස්ථානවලට සැපැයීමේ ආදි කටයුත්ත තවදුරටත් කර ගෙන යමින් මෙම මුල් කාලයේ පොළවල් බොහොමයක් ම පසුව ප්‍රධාන එළවළු තොග වෙළෙඳ ස්ථාන බවට පත් විණි. 1940 ගණන්වල මුල් වකවානුවේ දී පැරණි පොළවල් තවදුරටත් පවත්වා ගෙන යන අතරම ඒවා අතරපෙදෙස් වෙනත් දිනවල ක්‍රියාත්මක වෙන අළුත් පොළවලින් පිරී ගියේ ය. ජනගහණය වැඩි පෙදෙස්වල මෙම අළුත් පොළවල් හනික බිහි විණි.

මීට වසර දෙකකට පමණ කලින් (1978) පැවැති තත්ත්වය අනුව දිවයිනේ ගම්බද වෙළෙඳ පොළවල සංඛ්‍යාව 550 ක් පමණ වන තෙක් වැඩි වී තිබිණි. මෙම පොළවල් අතුරෙන් 63% ක් සතියකට වරක් පමණක් පැවැත් වෙන අතර, 37% ක් සතියකට දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් පැවැත් වේ. ගම්බද පොළවල් අතුරෙන් 326 ක පමණ අයිතියත්, පාලනයත් පෞද්ගලික වෙළෙඳුන් අත රැඳී පවතින අතර තවත් 67 ක පාලනය පළාත් පාලන බල මණ්ඩල මගිනි. ඉතිරි 126 ඒ ඒ පළාත් පාලන බල මණ්ඩල මගින් පෞද්ගලික වෙළෙඳුන්ට බදු දී ඇත. පොළවල් ඉතා වැඩි ගණනක් ඇති දිස්ත්‍රික්ක හැටියට බදුල්ල, කොළඹ සහ කුරුණෑගල දැක්විය හැකි ය. ගම්බද පොළවල පිහිටීම කෙරෙහි බලපාන ප්‍රධාන කරුණු වශයෙන් පෙන්වා දෙනු ලබන්නේ ජනගහණය බෙදී යාමත්, කෘෂිකාර්මික ඉඩම් පාවිච්චියේත් රටාව ය.

විවිධ පොළවල්

**උදහරණ:** මද ජනගහණයක් සිටින මන්නාරම දිස්ත්‍රික්කයෙහි ගම්බද පොළවල් නොමැති අතර ඉතාම වැදගත් ආර්ථිකමය කටයුත්ත හැටියට වී ගොවිතැන කෙරෙන පොළොන්නරුවෙහි ඇත්තේ පොළවල් තුනක් පමණි.

පළාත් පාලන කොමසාරිස් විසින් සපයන ලද දත්ත පදනම් කර ගෙන ශ්‍රී ලංකාවේ ග්‍රාමීය පොළවල් දිස්ත්‍රික්ක මට්ටමින් බෙදී ඇති ආකාරය පිළිබඳ මර්වින් ඩී. ද සිල්වා විසින් (1978) ඉදිරිපත් කරන ලද විස්තරයක් මෙසේ ය.

| | | |
|---|---|---|
| බදුල්ල | ...... | 84 |
| කොළඹ | ...... | 79 |
| කුරුණෑගල | ... | 65 |
| යාපනය | ...... | 51 |
| මාතර | ... | 38 |
| පුත්තලම | ... | 26 |
| කෑගල්ල | ... | 25 |
| හම්බන්තොට | ... | 22 |
| රත්නපුරය | ... | 21 |
| ගාල්ල | ... | 18 |
| මොනරාගල | ... | 17 |
| කළුතර | ... | 16 |
| මඩකලපුව | ... | 13 |
| මහනුවර | ...... | 12 |
| අනුරාධපුරය | ...... | 11 |
| අම්පාර | ...... | 07 |
| මාතලේ | ...... | 07 |
| නුවරඑළිය | ...... | 04 |
| ත්‍රිකුණාමලය | ...... | 04 |
| වවුනියාව | ...... | 04 |
| පොළොන්නරුව | ...... | 03 |
| මන්නාරම | ...... | 00 |
| | | 527 |

මෙම ග්‍රාමීය පොළවල් පුළුල් වශයෙන් කොටස් තුනකට බෙද වෙන් කළ හැකි ය.

(අ) නිෂ්පාදකයන් සඳහා මූලිකව පවත්වා ගෙන යන,

(ආ) පාරිභෝගිකයන් සඳහා මූලිකව පවත්වා ගෙන යන සහ,

(ඇ) නිෂ්පාදකයන් සහ පාරිභෝගිකයන් දෙපිරිසම සඳහා හවුලේ පවත්වා ගෙන යන ඒවා වශයෙනි.

දිවයිනේ බටහිර සහ දකුණු දිග කොටස්වල මහ නගර හා නාගරික මධ්‍යස්ථානයන්හි මූලික ලෙස පාරිභෝගිකයන් සඳහා වන පොළවල් වැඩි වශයෙන් පිහිටා ඇත. මූලික ලෙස නිෂ්පාදකයන් සඳහා වන පොළවල් බදුල්ල, යාපනය, හම්බන්තොට සහ මාතර යන දිස්ත්‍රික්කවල දක්නට තිබේ. සෙසු දිස්ත්‍රික්ක බොහොමයකම පොළවල් නිෂ්පාදකයන් හා පාරිභෝගිකයන් යන දෙපිරිසම සඳහා පවත්වා ගෙන යන ඒවා ය.